(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 81.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 සැප්තැම්බර් 11 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

196/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුළ සිදුකර ඇති ඉන්දියානු ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ එමඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ලැබෙන දායකත්වය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ කර ඇති ඉන්දියානු ආයෝජන සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

219/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ කුඹුරු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ හේතුවෙන් අපේක්ෂිත වී අස්වැන්නේ සිදු වන අඩු වීම කොපමණද;

(iii) විනාශ වූ කුඹුරු අතරින් නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) විනාශ වූ කුඹුරු සඳහා වන්දි ලබාදී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

226/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ ස්ටාර් ආයතනය (StAR Initiative) යන ආයතනවල සහය ලබා ගැනීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එම ආයතන මඟින් තාක්ෂණික සහ උපදේශන සේවා ලබා ගැනීමේ ප්‍රගතිය එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ආයතන මඟින් තාක්ෂණික සහ උපදේශන සේවාවන් ලබා ගැනීමේ ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

263/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන කවරේද;

(iii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය කවරේද;

(v) එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම කවරේද;

(vi) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

313/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෞද්ගලික විදුලි ජනන සමාගම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සමාගමේ නම හා ලිපිනය සහ ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයූ විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ සඳහා එක් එක් සමාගමට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(v) එම විදුලි ජනනය සඳහා යොදා ගනු ලබන බලශක්ති ක්‍රමවේද පුනර්ජනනීය බලශක්තියද නැතහොත් තාප බල ශක්තියද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

340/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය පෝරතිව් සහ පලුකාමම් යන ප්‍රදේශ සම්බන්ධ කරමින් ඉදිකර ඇති පාලම ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්;

(ii) එම පාලමෙන් ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම ජනතාවට දැඩි දුෂ්කර කාර්යයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

597/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් හදිසි සහතික (EC passport) නිකුත් කිරීම 2024.12.24 දිනෙන් පසුව නවතා ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා හේතුවූ කරුණු කවරේද;

(iii) ඉන්දියාවේ සහ නේපාලයේ වන්දනා ගමන් සඳහා පිටත්ව යන වන්දනාකරුවන් සඳහා සහ විවිධ රෝගවලට ඉන්දියාවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට පිටත්ව යන රෝගීන් සඳහා ඒ වෙනුවට ලබාදී ඇති විකල්පය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

8.

622/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාවූ ආපදා සිද්ධීන් සංඛ්‍යාව, එම සිද්ධීන්වලදී ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ආපදා කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ලෝකයේ බොහෝ රටවල් ආපදා කළමනාකරණය සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන බව දන්නේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

726/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට වර්ෂයකට ආනයනය කරනු ලබන අර්තාපල් අල ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරනු ලබන අර්තාපල් අල සඳහා අය කරනු ලබන බද්ද කොපමණද;

(iii) මේ දිනවල නුවරඑළිය, වැලිමඩ, ඌව පරණගම සහ හපුතලේ යන ප්‍රදේශවල අර්තාපල් අල අස්වැන්න නෙලන බව දන්නේද;

(iv) එබැවින් ශ්‍රී ලංකාවේ අර්තාපල් අල අස්වැන්න නෙලන කාල වකවානුවේදී ශ්‍රී ලංකාවට අර්තාපල් අල ආනයනය නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1122/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ සේවය කරනු ලබන සිවිල් සේවකයන් සහ සේවිකාවන් සංඛ්‍යාව යුධ, ගුවන් සහ නාවික අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් නියැලී සිටින වෘත්තීන් කවරේද;

(iii) ඔවුන් අතරින් සේවය ස්ථිර කර ඇති සිවිල් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තාවකාලික පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සිවිල් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) තාවකාලික පදනම මත සේවය කරන ලද සිවිල් සේවකයන් අවසන් වතාවට ස්ථිර කරන ලද වර්ෂය කවරේද;

(vi) තාවකාලික පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සිවිල් සේවකයන් ස්ථිර කිරීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) තාවකාලික පදනම මත සේවය කරනු ලබන සිවිල් සේවකයන් ස්ථිර කිරීමට අදාළ ක්‍රියාපටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ත්‍රිවිධ හමුදාවල සිවිල් සේවක පුරප්පාඩු තිබේද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 123 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් දහතුන් බිලියන දෙසිය අසූපස් මිලියන හයසිය දහසක් (රු. 13,285,600,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **123** | - | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 13,285,600,000 |
| | | | **මුළු එකතුව** | **රු. 13,285,600,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*3.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 171 — වැඩසටහන 02— † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක්දහස් පන්සියයක් (රු. 1,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **171** | - | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 1,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 1,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 අගෝස්තු 22 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රු. 13,285,600,000

*4.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*8.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***